# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல / My Ref. | CSS/7/1/9 | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2019.01.16 |
|---|---|---|---|---|---|

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03-2016(III)**

ලේකම්,
ප්‍රධාන අමාත්‍යාංශය,
දකුණු පළාත.

**<u>ප්‍රසම්පාදන කමිටු සීමාවන් සංශෝධනය කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ප්‍රසම්පාදන කමිටු සීමා පිළිබඳව 2016.08.24 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016, 2016.12.27 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016(I) හා 2018.11.14 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 (II) ට අතිරේක වශයෙනි.

02. වර්තමානයේ අමුද්‍රව්‍යවල මිල, කම්කරු කුලී හා තාක්ෂණික සේවාවල මිල ඉහළ යාම මත රෝහල් හා අනෙකුත් අදාළ සෞඛ්‍ය ආයතනවල සුළු අලුත්වැඩියා කටයුතු ඉටුකර ගැනීම ගැටළු සහගත වී ඇති බැවින්, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන් වඩාත් කාර්යක්ෂමව ඉටුකරගැනිමේ සේවා අවශ්‍යතාවයන් මත එම චක්‍රලේඛය මගින් නියමකර ඇති සුළු වටිනාකම් සහිත අලුත්වැඩියා වැඩ, භාණ්ඩ හා සේවා සෘජු මිළදී ගැනීම්වලට අදාළ ප්‍රසම්පාදන කමිටු සීමාවන් වැඩිකර දෙන ලෙස පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ ඉල්ලීම මත පළාත් සෞඛ්‍ය සේවා අමාත්‍යාංශ ලේකම් නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කර තිබුණි.

03. ඒ අනුව, දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට පමණක් අදාළ වන සේ ප්‍රසම්පාදන කමිටු සීමාවන් පහත සඳහන් පරිදි සංශෝධනය කිරීම සඳහා 2018.11.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 829 මගින් ගරු අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇති අතර, ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2019.01.05 දිනැති ආණ්ඩුකාර ලේකම්ගේ අංක : G/SP/1/6/3/11 ලිපිය මගින් ලැබී ඇත.

04. එබැවින්, ඔබ අමාත්‍යාංශය යටතේ පවතින පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අදාළ ප්‍රසම්පාදන කටයුතුවල දී පහත සඳහන් ප්‍රසම්පාදන සීමා අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

**422.1.(ඇ) - සුළු වටිනාකම් සහිත අලුත්වැඩියා වැඩ, භාණ්ඩ හා සේවා සෘජු මිළදී ගැනීම් (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5 හෝ 3.6) (ශ්‍රී ලංකා රජයේ අරමුදල් හෝ විදේශ අරමුදල් භාවිතා කරන )**

| බල අධිකාරිය | සම්පූර්ණ කළ යුතු කරුණු | දැනට අනුමත අධිකාරී සීමාව | සංශෝධිත අධිකාරී සීමාව |
|---|---|---|---|
| 1.පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා. මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 හි සඳහන් විධිවිධාන සපුරාලන විට | රු. 100,000 දක්වා | රු. 200,000 දක්වා |

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.

| | | | |
|---|---|---|---|
| 2.පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | වැඩ<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිමැසුම්දායී නොවන විට<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානී සහතික විය යුතුය.<br>මෙම අධිකාරී බලය දෙපාර්තමේන්තු ප්‍රධානී/ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතු අතර වෙනත් පුද්ගලයෙක් වෙත පැවරීමට නොහැක. | රු. 100,000 දක්වා | රු. 200,000 දක්වා |
| 3.දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් බලය පවරන ලද ප්‍රාදේශීය ප්‍රධානීන් හෝ අදාළ ඒකක (දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ / A හා B මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරි) | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා. මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 හි සඳහන් විධිවිධාන සපුරාලන විට | රු. 50,000 දක්වා | රු.100,000 දක්වා |
| 3.දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් බලය පවරන ලද ප්‍රාදේශීය ප්‍රධානීන් හෝ අදාළ ඒකක (දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ / A හා B මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරි) | වැඩ<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිමැසුම්දායී නොවන විට<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානී සහතික විය යුතුය.<br>මෙම අධිකාරී බලය දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ/ වෛද්‍ය අධිකාරීගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතු අතර වෙනත් පුද්ගලයෙක් වෙත පැවරීමට නොහැක. | රු. 50,000 දක්වා | රු.100,000 දක්වා |

05. ඉහත ප්‍රසම්පාදන සීමාවන්ට අමතරව, අනෙකුත් ප්‍රසම්පාදන කටයුතුවල දී උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ප්‍රසම්පාදන කමිටු සීමා පිළිබඳව, 2016.08.24 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016, 2016.12.27 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016(I) හා 2018.11.14 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 (II) වඅනුව කටයුතු කරන ලෙස වැඩිදුරටත් දැනුම් දෙමි.

ආර්.සී. ද .සොයිසා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් - 01. සහකාර විගණකාධිපති, දකුණු පළාත - දැ.ගැ.ස
02. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, දකුණු පළාත - අ.ක.ස
03. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත - දැ.ගැ.ස
04. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ, දකුණු පළාත - දැ.ගැ.ස